**ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ රාජ්‍ය ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් සභාගත කරන ලද ස්ථාවර නියෝග 119(4) සම්බන්ධයෙන් නිරීක්ෂණ හා ගනු ලබන පියවරයන් පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීම**

**පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා අංක 290**

**දිස්ත්‍රික් ලේකම් කාර්යාලය: ගම්පහ**

| රා.ගි.කා. සභාව විසින් පෙන්වා දෙන ලද අඩුපාඩු මා මඟපෙන්වීම් | ගණන් දීමේ නිළධාරී විසින් ගත් ක්‍රියාමාර්ග | වර්තමාන ප්‍රගතිය |
|---|---|---|
| **1.**2016.12.29 දිනැති අංක 2016/30 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදයේ සඳහන් විධිවිධාන ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සතු වාහනවල ඉන්ධන දහනයවීම පිළිබඳ පරීක්ෂාකර නොතිබුණි. | ඉන්ධන හිඟය හේතුවෙන්, ඉන්ධන ලබා ගැනීම සීමා කර තිබූ බැවින් ඉන්ධන දහන පරීක්ෂා කිරීමේ කටයුතු තාවකාලිකව අත්හිටුවා තිබුණි. ඉන්ධන දහන පරීක්ෂාව මාණ්ඩලික නිලධාරින් දෙදෙනෙකුගේ සහභාගීත්වයෙන් යුතු කමිටුවක් මඟින් සිදුකරන ලෙස 2023.02.02 දිනැති ලිපිය මගින් සියළුම ප්‍රාදේශීය ලේකම්වරු දැනුවත් කර ඇත. ඒ අනුව ඉන්ධන දහනයවීම පරීක්ෂාව නියමිත පරිදි සිදුකරනු ලැබේ. | මේවන විට 2016.12.29 දිනැති අංක 2016/30 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදයේ සඳහන් විධිවිධාන ප්‍රකාරව අදාල ඉන්ධන දහන පරීක්ෂාව සිදුකරන බව කාරුණිකව දන්වමි. |
| **2.** සියළු වාහනවල අයිතිය තහවුරුකරන ලිපි සන්තකයේ නොමැති අතර සියළු වාහනවල රාජ්‍ය ලාංඡනය පින්තාරුකර නොතිබුණි. | CAO-1650 කාර් රථය හැර අනෙකුත් සියළුම වාහනලව අයිතිය තහවුරු කරන ලිපි ලේඛණ පවතින බව දන්වන අතර මෙම වාහනය රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන රාජ්‍ය අමාත්‍යාංශයට අයත් බැවින් අයිතිය පවරා ගැනිමට අදාල ලිපි ලේඛන අමාත්‍යාංශය වෙත යොමුකර ඇත.<br>තවද රාජ්‍ය ලාංඡනය නොමැති වාහනවල, රාජ්‍ය ලාංඡනය පින්තාරු කිරිමට  අවශ්‍ය කටයුතු සිදුකරගෙන යනු ලැබේ. | අදාල කරුණු සම්බන්ධයෙන් ඉදිරි කටයුතු සිදුකර ඇති බැවින් අදාල කටයුතු කඩිනමින් අවසන් කිරිමට කටයුතු කරමි. |
| **3.** සමාලෝචිත වර්ෂයේදී හෝ ඊට | පෙර වර්ෂවල සිට පැවත එන අක්‍රිය ගිණුම් වසා දැමීමට | මේවන විට අක්‍රිය බැංකු ගිණුම් නොමැති බව දන්වමි. |

<table>
<tr>
<td>පෙර වර්ෂවල සිට පැවත එමින් තිබූ අක්‍රිය බැංකු ගිණුම් නිරවුල් කර නොතිබුණි.</td>
<td>කටයුතු කර ඇති අතර මේවන විට අක්‍රිය බැංකු ගිණුම් නොමැති බව දන්වමි.</td>
<td></td>
</tr>
<tr>
<td>4. වර්ෂයකට වඩා වැඩි කාලයක සිට පැවත එන හිඟ ණය ශේෂ පැවතුණි.</td>
<td>මෙම ණය ශේෂ අයකර ගැනීම සඳහා නිරන්තරයෙන් පසු විපරම් කටයුතු කර ඇත. බොහෝ ණය අදාල ණය ලාභීන්ගේ විශ්‍රාම පාරිතෝෂිකයෙන් අයකර ගැනීම සඳහා තීරණය කර
<table>
<tr><th>වර්ගීකරණය</th><th>2021.12.31 දිනට ශේෂය</th><th>2024.03.31ට අයවීම්</th></tr>
<tr><td>මිය ගිය නිලධාරීන්</td><td>441,531.00</td><td>441,531.00</td></tr>
<tr><td>විශ්‍රාම ගිය නිලධාරීන්</td><td>2,061,115.00</td><td>1,574,976.00</td></tr>
<tr><td>වැඩ තහනම් කර ඇති නිලධාරීන්</td><td>1,130,142.00</td><td>620,809.00</td></tr>
<tr><td>සේවය හැර ගිය නිලධාරීන්</td><td>313,498.00</td><td>220,668.00</td></tr>
<tr><td></td><td>3,946,286.00</td><td>2,857,984.00</td></tr>
</table>
ඇති අතර ඒ සඳහා අදාල ක්‍රියාමාර්ග ගෙන ඇත.<br>
2024.03.31 වන විට බොහෝමයක් ණය ශේෂ අයවී ඇති අතර අනිකුත් ශේෂ හැකිතාක් දුරට 2024 වර්ෂය තුල අයකර ගැනීමට කටයුතු කරමි.</td>
<td>තවදුරටත් අයවීමට ඇති ශේෂ වලින් බොහෝමයක්, ණය ලාභීන්ගේ විශ්‍රාම පාරිතෝෂිකයෙන් අයකර ගැනිම හැකි බැවින් ඒ සඳහා අවශ්‍ය කටයුතු සිදුකර ඇති අතර 2024 වර්ෂය තුල උපරිම ලෙස අයවීමට ඇති හිඟ ශේෂ අයකර ගැනීමට කටයුතු කරමි.</td>
</tr>
<tr>
<td>5. පොදු තැන්පත් ගිණුමේ කල් ඉකුත්වූ තැන්පතු සම්බන්ධයෙන් මු.රෙ.571 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.</td>
<td>පොදු තැනපත් ගිණුමේ ශේෂ නිරවුල් කිරිම සඳහා පසුගිය වර්ෂ කිහිපය තුලම විධිමත් වැඩපිළිවෙලක් සකස් කර බොහෝමයක් ශේෂ නිරවුල් කිරිමට කටයුතු කර ඇති බව දන්වමි. එසේම වන්දි ගෙවීම් නිරවුල් කිරීම සඳහා විශේෂ වැඩපිළිවෙලක් යොදා ඇති අතර අධිවෙගී මාර්ග සඳහා අත්පත් කර ගැනීම් යටතේ වන්දි මුදල් ප්‍රමාණවත් නොවීම නිසා ලබා</td>
<td>2022.12.31 වන විට, තැන්පතු ගිණුම් අංක 6000-0-0-1-0-61 (ඇප තැන්පත්), 6000-0-0-2-79 (ටෙන්ඩර් තැන්පත්) , 6000-0-0-13-49 (තෙවන පාර්ෂව වෙත ගෙවීම්) හා 6000-0-0-18-39 (ව්‍යවස්ථාපිත ගෙවීම්) යටතේ වර්ෂ 2ට වැඩි කිසිදු තැන්පතුවක් නොමැති අතර කොන්ත්‍රාත් රැඳවුම් (6000-0-0-16-31) යටතේ වසර 2ට වැඩි තැන්පතු ශේෂය වන රු.14,104,972.11ක මුදල නිරවුල් කිරිමට</td>
</tr>
</table>

| | | |
|---|---|---|
| | නොගෙත් වන්දි මුදල් වැඩි ප්‍රමාණයක් මෙම මුදල නියෝජනය වන අතර එම එකඟතාවයන් ලැබෙන තෙක් අදාල වන්දි මුදල් තැන්පත් ගිණුමේ රඳවා ගැනීමට සිදුවේ. තවද ඉඩම් ආරවුල්, වන්දි ලාභීන් විදේශගතවීම ආදී හේතුමත මෙම වන්දි මුදල් නිරවුල් කිරීම ප්‍රමාද වීම සිදුවේ. කෙසේ වෙතත් මෙම තැන්පතු ශේෂ 2024 වර්ෂය තුල හැකිතාක් නිරවුල් කිරීමට කටයුතු කරමි. | කොන්ත්‍රාත් කරුවන් දැනුවත් කර ඇති අතර 2024 වර්ෂයේදී නිරවුල් කිරීමට බලාපොරොත්තු වේ. එසේම ඉඩම් තැන්පතු (6000-0-0-17-0-10) යටතේ තවදුරටත් පවතින වසර 10ට වැඩි තැන්පතු ශේෂය වන රු.86,883,880ක මුදල ඉඩම් ආරවුල් හේතුවෙන් නිරවුල් කිරීමේ ගැටළු පැන නැඟී ඇත. එම ශේෂයද 2024 වර්ෂය තුල නිරවුල් කිරීමට බලාපොරොත්තු වේ. |
| **6.**රැස්කළආදායම් අදාල විධිවිධානවලට අනුකූලව ආපසු ගෙවා නොතිබුණි. | යැවිය යුතු වාර්තා නියමිත පරිදි යැවීමට නිලධාරීන්ට උපදෙස් ලබා දී ඇත. | චක්‍රලේඛ විධිවිධාන පරිදි කටයුතු කරනු ලැබේ. |
| **7.** මු.රෙ.119 ප්‍රකාරව අයකල යුතු අධිභාර අයකර නොතිබුණි. | 2014 වර්ෂයේ මහර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ සිදු වූ මුදල් වංචාව සම්බන්ධයෙන් වගකිව යුතු නිලධාරීන්ගෙන් අයවිය යුතු අලාභයෙන් රු.63,366.96ක මුදලක් අයවී ඇති අතර ඉතිරි මුදල් අයකර ගැනිම සඳහා අදාල නිලධාරීන්ට හා ආයතන වලට නිරන්තර දැනුවත් කිරිම් සිදු කර ඇත. | 2014 වර්ෂයේ මහර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ සිදු වූ මුදල් වංචාව සම්බන්ධයෙන් අදාල නිලධාරීන් හතර දෙනාගෙන් රු.338,201.69 බැගින් සමානව අයකරගැනීම අදාල ලිපි යොමුකර ඇති අතර නිරන්තර සිහිකැඳවීම් ලිපිද යොමුකර ඇත. ඒ අනුව අයවිය යුතු අලාභයෙන් රු.63,366.96ක මුදලක් අයවී ඇති අතර ඉතිරි මුදල් අයකර ගැනිම සඳහා අදාල නිලධාරීන්ට හා ඔවුන් සේවය කරන ආයතන වලට නිරන්තර දැනුවත් කිරිම් සිදු කර ඇත. |

ලලින්ද ගමගේ
දිස්ත්‍රික් ලේකම්/දිසාපති,
ගම්පහ පරිපාලන දිස්ත්‍රික්කය.

ලලින්ද ගමගේ
දිස්ත්‍රික් ලේකම් / දිසාපති
ගම්පහ පරිපාලන දිස්ත්‍රික්කය

එල්.ඒ
ප්‍රධාන ගණකාධිකාරි ,
ගම්පහ පරිපාලන දිස්ත්‍රික්කය

එල්.ඒ.බී.එල්. ගුණසේන
ප්‍රධාන ගණකාධිකාරි
දිස්ත්‍රික් ලේකම් කාර්යාලය
ගම්පහ.